(84)

15 OCT 2001
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1182/6 – 2001 අප්‍රේල් 30 වැනි සඳුදා – 2001.04.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

### සබරගමුව පළාත් සභාව

1998 අංක 02 දරන සබරගමුව පුස්තකාල සේවා මණ්ඩලය – ප්‍රඥප්තිය

| | | |
|---|---|---|
| සහතික සටහන් කළේ | : | 1998 මැයි මස 07 වැනි දින. |
| අනුමැතිය ලැබුනේ | : | 2001 අප්‍රේල් මස 05 වැනි දින. |

සබරගමුව පළාත් සභාවේ නියමය පරිදි,

එම්. එම්. යූ. ධම්මික,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

සබරගමුව පළාතේ 1998 අංක 02 දරන
සබරගමුව පුස්තකාල සේවා මණ්ඩලය – ප්‍රඥප්තිය

සබරගමුව පළාතේ පුස්තකාල සංවර්ධනය කිරීම, පෝෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒවායේ ගුණාත්මක භාවය ස්ථාපිත කිරීම සඳහා ද, සේවා විවිධාංගීකරණය සඳහා ද සබරගමුව පළාතේ පුස්තකාල සේවා මණ්ඩලය පිහිටුවීමට ද, ප්‍රාදේශීය පුස්තකාල සේවා මණ්ඩලයක් පිහිටුවීමටද, ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික කාරණ සඳහා විධිවිධාන සැලසීම පිණිස වූ ප්‍රඥප්තියකි.

1A – PG 000207 – 415 (2001 / 04)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය හා ක්‍රියාත්මක වන දිනය.

01. මෙම ප්‍රඥප්තිය 1998 අංක 02 දරන "සබරගමුව පුස්තකාල සේවා මණ්ඩලය ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර එය සබරගමුව ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

02. මින්මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන සබරගමුව පුස්තකාල සේවා මණ්ඩලය පිහිටවනු ලැබිය යුතු අතර මෙහි 5 වන වගන්තියේ 1 වන උප වගන්තියේ සඳහන් තැනැත්තන් මෙම මණ්ඩලයේ සාමාජිකයන් වනු ඇත.

03. 2 වන වගන්තිය මගින් මණ්ඩලයට පවරා දෙන ලද නාමයෙන් එය සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය.

මණ්ඩලයේ පරමාර්ථ.

04. මතු සඳහන් පරමාර්ථ සඳහා මණ්ඩලය පිහිටවනු ලබන්නේය:–

(අ) සබරගමුව පළාතේ පුස්තකාල ව්‍යුහය විධිමත්භාවයට පත් කිරීම තුළින් ඒවායේ මනා සංවර්ධනයක් ඇති කිරීම හා ඒ මගින් ජනතාවගේ අවබෝධය හා කෞශල්‍යය වර්ධනය කිරීමට රුකුල්දීම.

74903
15 OCT 2001
NATIONAL LIBRARY AND
DOCUMENTATION CENTRE

(ආ) පළාතේ මහජන, පාසල්, විශේෂ පිරිවෙන්, ස්වේච්ඡා, ග්‍රාමීය ස්වේච්ඡා සංවිධාන සහ වතු ක්ෂේත්‍රයේ පුස්තකාලවලට ආධාරවන මධ්‍යගත සේවා ඉටු කිරීම.

(ඇ) චර්යාවන්ගේ හා ආකල්පමය වශයෙන් ජීව හිතවාදී සමාජයක් ගොඩනැංවීමේ පසුබිමක් ඇති කිරීමේ කාර්යභාරයේ දී හා ජාතික සංවර්ධනයට ඵලදායීව මහජන සහභාගිත්වයක් ලබා ගැනීමේ දී ප්‍රාදේශීය දායකයෙකු වශයෙන් පුස්තකාල මගින් ඉටුවිය යුතු මෙහෙය වඩාත් තීව්‍ර කිරීමේ අරමුණින් නව පුස්තකාල ආරම්භ කිරීම, පාලනය විධිමත් කිරීම ක්‍රමානුකූලව සම්පත් බෙදා හැරීම.

(ඈ) ශ්‍රම බලකායේ අපේක්ෂාවන් ඉටුකර ගැනීමට අවශ්‍ය ශිල්පීය ඥානය හා කුශලතා වර්ධනය කිරීමට උපකාරී වන වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යාපනික ක්ෂේත්‍ර පුස්තකාල ව්‍යුහයට අන්තර්ගත කිරීම.

(ඉ) පුස්තකාල සම්පත්වල ඵලදායීතාව වර්ධනය වන ආකාරයට රාජ්‍ය – අර්ධ රාජ්‍ය – අනුබද්ධ – ස්වේච්ඡා සංවිධාන – පුද්ගල යන කුමන හිමිකමකින් කියවුන ද එම පුස්තකාල අන්තරී සම්බන්ධතා ගොඩ නැගීම.

(ඊ) සෙසු පුස්තකාලවලට, මාර්ගෝපදේශකත්වය දීමටත් සම්පත් සම්පාදනයටත් ග්‍රන්ථ හා ලේඛනාරක්ෂණයට සමත් අංගසම්පූර්ණ පළාත් මධ්‍යම පුස්තකාලයක් පිහිටුවීම.

(උ) විවිධ අංශයන්ට අයත් පුස්තකාලවලට අදාළ විවිධ දත්තයන් රැස් කිරීම හා ඊට අදාළ පරීක්ෂණ පැවැත්වීම.

(ඌ) පළාතට සුවිශේෂ වූ දුර්ලභ වූද ග්‍රන්ථ හා විවිධ ලේඛනයන්හි මුල් පිටපත් හෝ අනුරූ පිටපත් සපයා රැස් කිරීම.

(එ) විවිධ විෂයයන් සම්බන්ධයෙන් පාඨකයන් දැනුවත් කිරීම සඳහා දේශන සම්මන්ත්‍රණ හා වෙනත් වැඩ සටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඒ) පාඨකයින් වෙත විධිමත් සේවාවක් සැපයීමට හැකියාවක් ඇති කරනු වස් පුස්තකාල ක්ෂේත්‍රයේ විවිධ කාර්ය මණ්ඩලයක් පුහුණු කිරීම.

(ඔ) පාසල් සිසුන්ගේ ද කාර්මික විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සිසුන්ගේ ද ආයතනික අධ්‍යාපනයෙන් බැහැර වූවන්ගේ හා වෙනත් විවිධ තරාතිරම්වල පාඨකයින්ගේ කියවීමේ අර්ථවත් භාවය හා රුචිකත්වය වර්ධනය වන ආකාරයට පොතපතින් හා ශ්‍රව්‍යදෘශ්‍ය භාණ්ඩයන්ගෙන් පුස්තකාල පෝෂණය කිරීම.

(ඕ) සබරගමුව පළාතේ ලේඛක නවීනයන් හා ප්‍රවීනයන් ග්‍රන්ථ කරණයෙහි කාර්යක්ෂම කරනු වස් අවශ්‍ය අනුග්‍රහයන් ලබා දීම සඳහා හඳුනාගැනීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීම.

(අං) අනෙකුත් පළාත් හෝ දීප ව්‍යාප්ත පුස්තකාල කාර්යයන්හිදී අවශ්‍යවේනම් සබරගමුව පළාත නියෝජනය කිරීම.

(අඃ) පළාත් පුස්තකාල ලේඛනයක් පවත්වාගෙන යාම හා පුස්තකාල ලියාපදිංචි කිරීම.

(ක) දුර්ලභ හා ජාතික වටිනාකමින් යුතු සබරගමුව පළාත තුළ ඇති ලේඛන හා සම්පත් සංරක්ෂණයට කටයුතු යෙදීම.

(ග) පළාතේ පුස්තකාලයන්හි ප්‍රමිතිය පිළිබඳව තීරණ ගැනීම.

(ජ) පුස්තකාල සංවර්ධනයට අදාළව බැහැරින් ලැබෙන ප්‍රදානයන් භාරගැනීම හා බෙදා හැරීම.

05. (i) (අ) සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සභාපතිවරයෙකු, — මණ්ඩලයේ සාමාජිකත්වය.

(ආ) සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු (මහජන, විශේෂ හා ස්වේච්ඡා පුස්තකාල නියෝජනය වන ලෙස)

(ඇ) සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජනය සඳහා එහි ලේකම් විසින් නම් කරනු ලබන්නෙකු,

(ඈ) සබරගමුව පළාතේ පළාත් පාලන කොමසාරිස්,

(ඉ) සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන්නෙකු,

(ඊ) ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ නියෝජිතයෙකු,

(උ) පළාතේ ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයා වශයෙන් පළාත් පුස්තකාල සේවා මණ්ඩලය සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(ii) 5 – 1 උප වගන්තිය යටතේ පත් කරනු ලබන යම් සාමාජිකයෙකුගේ පත්වීම, සබරගමුව පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකිය.

(iii) සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වරයා විසින් එම අමාත්‍යාංශයේ නියෝජනය සඳහා මණ්ඩලයට පත් කරනු ලබන්නා මණ්ඩලයේ ලේකම්වරයා විය යුතුය. මණ්ඩලයේ ගිණුම් නිලධාරියා විය යුත්තේ ද ඔහුම වේ. තවද මණ්ඩලයේ සියලුම චෙක්පත් අත්සන් කිරීම හා වවුචර්පත් අනුමත කිරීම ඔහු විසින් කළ යුතු අතර මණ්ඩලයේ සභාපතිවරයා චෙක්පත් සඳහා අත්සන් කිරීමට සහභාගී කරගත යුතුය. — අධිකාරියේ ලේකම් වරයා.

(iv) රැස්වීමක් සඳහා සභාපතිවරයා නොපැමිණි විටක පැමිණ සිටින සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කරනු ලබන යම් සාමාජිකයෙකු එදින රැස්වීමේ මුලසුන ගත යුතුය. — මණ්ඩලයේ සභාපති නැති විට රැස්වීම පැවැත්වීම.

(v) මණ්ඩලයේ රැස්වීම පැවැත්වීමට සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුතු ගණපූරණයක් අවශ්‍ය වේ. — ගණපූරණය.

අමාත්‍යවරයාගේ බලතල.

06. අවශ්‍ය පරිදි සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා තම අභිමතය පරිදි විශේෂ රැස්වීම් කැඳවිය හැකි අතර එම අවස්ථාවලදී ඔහු මුලසුන හොබවනු ඇත.

07. මණ්ඩලයේ යම් පුරප්පාඩුවක් හෝ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුගේ පත්වීම්වල දෝෂයක් තිබීමේ හේතුවෙන් නිසා පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වන ලෙස සලකනු නොලැබිය යුත්තේය.

සාමාජිකත්වයට නුසුදුසුකම්.

08. යම් තැනැත්තෙක් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ස්වකීය කාර්යයන් ඉටු කිරීමෙහිලා අහිතකර ලෙස බලපෑහැකි යම් මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවයක් දරන්නේ නම් ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීම සඳහා හෝ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස තවදුරටත් සිටීම සඳහා සුදුසුසෙකු නොවිය යුතුය.

09. (i) අවුරුදු තුනක කාලයක් සාමාජික ධූරය දැරිය යුතු අතර නැවත පත්කරනු ලැබීම සඳහා සුදුසසකු විය යුතුය. පත් කරන ලද සෑම සාමාජිකයෙකුම තමා මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා සාමාජිකත්වය අහෝසි වන්නේය.

(ii) මණ්ඩලයේ යම් සාමාජිකයෙකු මියගිය හෝ ධූරය හැරගිය හෝ ඔහු ධූරයෙන් ඉවත් කරන ලද හෝ අවස්ථාවක අමාත්‍යවරයා විසින් 5(1) උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කළ ආකාරයටම වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය. ඒ සාමාජිකයා විසින් පත් කරන ලද යම් තැනැත්තකු තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාල සීමාව තුළ ධූරය දැරිය යුතුය.

(iii) රෝගාතුරවීම නිසා හෝ විදේශගතවීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ස්වකීය ධූරයෙහි කාර්යය ඉටුකිරීමට යම් කාලසීමාවක් තුළ තාවකාලිකව නොහැකිවන අවස්ථාවක අමාත්‍යවරයා විසින් 5(1) උපවගන්තිය යටතේ ඇති විධිවිධානවලට අනුකූලව ඒ සාමාජිකයා පත් කරන ලද ආකාරයටම ඒ සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම පිණිස වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

සාමාජිකයින් ඉවත් කිරීම.

(iv) (අ) 5 වන වගන්තියේ එහි යටතේ පත් කරන ලද මණ්ඩලයේ යම් සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කිරීම සුදුසුයැයි අමාත්‍යවරයා අදහස් කරතොත් ඒ සඳහා හේතු සඳහන් නොකර ඔහු විසින් එසේ කරනු ලැබිය හැකිය.

(ආ) මෙහි 'අ' උපවගන්තිය යටතේ යම් සාමාජිකයකු ඉවත් කරනු ලැබීම කිසිම අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය හැකිය.

මණ්ඩලයේ සාමාජිකයින් ඉල්ලා අස්වීම.

10. ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් ඉදිරිපත් කිරීමෙන් ඕනෑම අවස්ථාවක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

11. මණ්ඩලයේ සාමාජිකයින්ට යම් පාරිශ්‍රමිකයක් නොගෙවිය යුතු නමුත් සභාවේ රැස්වීම්වලට සහභාගිවීම වෙනුවෙන් හෝ මණ්ඩලයේ කටයුතු සම්බන්ධයෙන් වූ වෙනත් එවැනි කාර්යයක් සඳහා ඔවුන් විසින් දරනු ලබන ගමන් වියදම්, අපනශාලා ගාස්තු හා ආනුෂංගික වියදම් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතුය.

මණ්ඩලයේ රැස්වීම්.

12. (i) මණ්ඩලය අවම වශයෙන් සෑම ලිත් මාසයකට වරක්වත් රැස්විය යුතුය.

(ii) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් ඔහු සභාවේ සියළු රැස්වීම්වලට මුලසුන දැරිය යුතුය. පැමිණ නොමැති නම් 5(iv) ඡේදයේ විධිවිධාන අනුගමනය කළ යුතුය.

බල ප්‍රදේශ.

13. පළාත් මධ්‍යම පුස්තකාල සේවා මණ්ඩලය හා එහි බලප්‍රදේශ ලෙස සබරගමු පළාත් සභා ප්‍රදේශයත් ඊට අයත් ප්‍රාදේශීය සභා කොට්ඨාශත් අයත් විය යුතුය.

14. මේ ප්‍රඥප්තියේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාමේ හා අවසන් කිරීමේදී, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාරගැනීමේ හා එකතු කිරීමේද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේද, පදනමේ නිලධරයන් සහ සේවකයින් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවකයින් සේවයේ යෙදවීමේ සහ පහ කිරීමේද, බලය ඇතුළුව මණ්ඩලයේ පරමාර්ථයන් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියළු ක්‍රියාවන් කිරීමේදී කරුණු ඉටු කිරීමේද, ක්‍රියාවේ යෙදවීමේද බලය මණ්ඩලයට ඇත්තේය.

15. (i) පළාත් සහා බල ප්‍රදේශය තුළ මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා මණ්ඩලයේ යෝජනා සම්මතයෙන් සියළුම තීරණ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය කටයුතු කරනු ලබන්නේය. මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම.

(ii) මණ්ඩලයේ තීරණවලට යටත්ව 1 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති කළමනාකරණය හා ඊට සම්බන්ධ කරුණු සඳහා ව්‍යාපෘති පිළිබඳව මනා දැනුමක් ඇති සාමාජිකයන් 5 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් කළමනාකරණ කමිටුවක් ලෙස ක්‍රියා කළ හැකිය.

(iii) අනුමත කරන ලද හා ඊට අනුබද්ධ සියළුම ව්‍යාපෘති මණ්ඩලයන්හි ලියාපදිංචි කළ යුතුය.

(iv) ලියාපදිංචි කරන ලද සියළුම ව්‍යාපෘති මණ්ඩලයේ පරමාර්ථවලට අනුකූලව ක්‍රියාත්මක විය යුතු අතර, අවශ්‍ය විටකදී මණ්ඩලයේ ආධාර ලබාදීමට පියවර ගනු ඇත.

(v) මෙහි 15(ii) වගන්තියට අනුකූලව ප්‍රාදේශීය මණ්ඩලය විසින් ද කළමනාකරණය කමිටුවක් බැගින් පත්කරගත යුත්තේය.

16. (i) මණ්ඩලයේ කටයුතු සඳහා (මෙහි මින්මතු "පුස්තකාල ගිණුම" නමින් හඳුන්වනු ලබන) "සබරගමුව පුස්තකාල ගිණුම" යනුවෙන් පළාත්සභා අරමුදලෙන් පවත්වාගෙන යායුතු වෙනම ගිණුමක් තිබිය යුත්තේය. සබරගමුව පුස්තකාල ගිණුම පිහිටුවීම.

(ii) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වන කොටසේ විධිවිධානවලට පුස්තකාල ගිණුම යටත් වන්නේය.

(iii) පහත සඳහන් ලැබීම් ප්‍රථමයෙන් පළාත් සභා අරමුදලට ගෙවා ඉන් අනතුරුව ඒවා පුස්තකාල ගිණුමට බැර විය යුතුය:-

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා සබරගමුව පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියළු මුදල් හා ත්‍යාග,

(ආ) අනෙකුත් ප්‍රභවයන්ගේ පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් මණ්ඩලයට ලැබෙන සියළු මුදල් සහ,

(ඇ) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ වෙනත් ආයතනයක් විසින් නීත්‍යානුකූලව මණ්ඩලයට පවරනු ලබන සියළු මුදල්.

(iv) පළාත් සභාවේ අනෙකුත් අමාත්‍යාංශ පුස්තකාල සඳහා වෙන්වී ඇති මුදල් ප්‍රතිපාදනවලින් උපරිම ප්‍රයෝජනය ගැනීමට පොදු ගිණුමක් ඇති කිරීම.

17. බලතල ක්‍රියාත්මක කිරීමේදී හා කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීමේදී මණ්ඩලය විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියළු මුදල් මණ්ඩලයේ ගිණුමෙන් ගෙවනු ලැබිය යුතුය. මුදල් හා දේපල යෙදවීම.

18. මිලට ගැනීමත්, ප්‍රදානයත්, ත්‍යාගයක් හෝ බද්දක් සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වන හෝ ප්‍රකාර, නැතහොත් යම් ඇස්තමේන්තුවක් බැහැර කිරීමක් හෝ අන්‍යාකාරයක් මත හෝ ප්‍රකාර වැඩදායී අයිතිකරු වශයෙන් හෝ අන්‍යාකාරයකින් චංචල හෝ නිශ්චල දේපල සම්බන්ධ හෝ තත් කාලයෙහි බලාත්මකව පවත්නා යම් ලිඛිත නීතියකට යටත්ව නීත්‍යානුකූලව මණ්ඩලයට හැකියාව හා බලය ඇත්තේය.

තවද, ඒ සියළු දේපල මණ්ඩලයෙහි තත්කාලයෙහි පවතින නීතිරීතිවලට යටත්ව නැතහොත් අදාළ සාධන පත්‍රයෙහි හෝ බැහැර කිරීමේ කොන්දේසිවලට යටත්ව භාරවල කාර්යය සඳහා හෝ (භාරවල අදාළ යම් ලිඛිත නීතියක සහ බැහැර කිරීමේ අදාළ සාධන පත්‍රයක වූ විධිවිධානවලට සෑම විටම යටත්ව) ඒ දේපල විකිණීමට, උකස් කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැඳ තැබීමට හෝ බැඳීමකට යටත් කිරීමට පූර්ණ බලය මේ ප්‍රඥප්තියේ කාර්යය සඳහා මණ්ඩලය විසින් දැරිය යුතුය.

ගිණුම් පාලනය.

19. (i) පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ විධිවිධානවලට යටත්ව ගිණුම නිසි පරිදි පරිපාලනය කළ යුතුය.

(ii) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය.

මණ්ඩලයේ මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය කිරීම.

(iii) මණ්ඩල විසින් මණ්ඩලයේ ආදායම සහ වියදම වත්කම් හා බැරකම් සහ වෙනත් සියළු කටයුතු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යා යුතුය.

(iv) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන්නා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

20. විගණන වාර්තාව ලැබීමෙන් පසු එළඹෙන පළමු රැස්වීමේදී එම වාර්තාව වාර්ෂිකව සභාවට ඉදිරිපත් කිරීම සඳහා උක්ත පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා වෙත භාරදිය යුතුය.

පළාත් මධ්‍යම පුස්තකාලයක් ආරම්භ කිරීම.

21. පළාතේ සෙසු පුස්තකාලවලට, මාර්ගෝපදේශකත්වය දීමටත් සම්පත් සම්පාදනයටත්, ග්‍රන්ථ හා ලේඛනාරක්ෂණයට ශ්‍රව්‍ය දෘෂ්‍ය නව උපකරණ පහසුකම් සහිත දේශන හා සම්මන්ත්‍රණ ශාලාවලින්ද යුක්ත අංග සම්පූර්ණ පළාත් මධ්‍යම පුස්තකාලයක් ස්ථාපනය කළ යුතුය. මෙය ශ්‍රී ලංකාවේ පුස්තකාල ප්‍රමිතිකරණයේ "අධි ශ්‍රේණිය" ලෙස සඳහන් වන්නක් විය යුතුය.

ජනරජයේ හා ආයතනයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

22. මේ ප්‍රඥප්තියේ සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන් කෙරෙහි නැතහොත් ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක, හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ ප්‍රඥප්තියේ අඩංගු කිසිවක් බලපෑමක් වන්නේ යැයි සලකනු නොලැබිය හැකිය.

අර්ථ නිරූපනය.

23. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථකථන අවශ්‍ය වුවහොත් මිස, මෙම ප්‍රඥප්තියෙහි, "ආණ්ඩුකාරවරයා" යන්නෙන් සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයා සඳහන් වන්නේය. "අමාත්‍යවරයා" යන්නෙන් සබරගමුව පළාතේ අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා සඳහන් වන්නේය. "ලේකම්" යන්නෙන් සබරගමුව පළාත් අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් අදහස් වන්නේය.

අනුකූලතාවන් ඇති විටෙක සිංහල පාඨය බලපැවැත්විය යුතු බව.

24. මෙම ප්‍රඥප්තියෙහි සිංහල පිටපත (ද්‍රවිඩ හා ඉංග්‍රීසි පිටපත්වල කුමක් සඳහන් වුවද) මෙහි යම් නීතිමය විමර්ශනයන්ගේ ගැටළු විසඳීමක් හෝ වෙන යම් අර්ථකථනයක් සඳහා මූලාශ්‍ර වශයෙන් යොදා ගත යුතුය.

1998 මැයි මස 7 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව සහතික කරමි.

හේමපාල දසනායක,  
සභාපති,  
සබරගමුව පළාත් සභාව.

1998 මැයි මස 13 වැනි දින.

2001 ක් වූ අප්‍රේල් මස 05 වැනි දින, දහතුන්ව ණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයේ 154උ(2) වගන්තිය යටතේ අනුමැතිය දෙමි.

සී. එන්. සාලිය ඩබ්ලිව්. මැතිව්,  
ආණ්ඩුකාරවර,  
සබරගමුව පළාත.

05-298

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි